**රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2017**

**-----------------------------------------------**

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**--------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ කටයුතු මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවන අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි.ව්‍යාපෘතියේ අරමුණ සබරගමුව පළාත සහ බස්නාහිර පළාතේ කොටසක ප්‍රවාහන හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීමයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ව්‍යාපෘතියේ වියදම් දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සදහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හදුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් සහ මෙම වාර්තාවේ 3.3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්වලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

ලද තොරතුරු අනුව,2017 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාමට රුපියල් මිලියන 120 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ප්‍රවර්තන වර්ෂය අවසන් වන විට එයින් රු. මිලියන 92.10 ක මුදලක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

-----------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බස්නාහිර පළාතේ කහතුඩුව සිට සබරගමු පළාතේ පැල්මඩුල්ල දක්වා වූ රුවන්පුර අධිවේගී මාර්ගයේ කිලෝ මීටර් 73.90 ක ඉදිකිරීම් වැඩ 2014 ඔක්තෝබර් 10 දින ආරම්භ කර තිබුණි,ඉදිකිරීම් වැඩ කොටස් 4 කට වෙන්කර තිබුණු අතර අනාගත සිවිල් ඉදිකිරීම් වැඩ සඳහා අවශ්‍ය ඉදිකිරීම් කොන්ත්‍රාත් කරුවන් චීන රජය විසින් නම් කර තිබුණි.

(ආ) විස්තරාත්මක සමස්ථ සැලසුම සහ ක්‍රියාකාරී සැලැසුම් මඟින් එහි ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් සමඟ භෞතික හා මූල්‍ය ඉලක්ක පැහැදිලිව හඳුනා ගත යුතු අතර එම සැලසුම් තුළින් ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ලඟා කර ගැනීමට අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග සකස් කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සඳහා ශක්‍යතා අධ්‍යයන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඒ සඳහා විශේෂඥ සේවා ලබා ගැනීමට රු. මිලියන 394.29 ක පිරිවැයකට එහි පරිපාලිත සමාගමක් සමඟ 2014 නොවැම්බර් 10 දින ගිවිසුමකට ඇතුලත්ව තිබුණි.කොන්ත්‍රාත්තුවට බිම් මැනීම,විමර්ෂණය,මූලික සැලසුම් සැකසීම,සමාජීය හා පාරිසරික බලපෑම් ඇගයීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් ආදී සේවාවන් ඇතුළත් වේ.කොන්ත්‍රාත්තුව යටතේ සැපයිය යුතු සේවාවන් 2016 මාර්තු අවසන් කිරීමට අවශ්‍ය වුවද ඒ පිළිබඳ වාර්තාව මාස 22 ක ප්‍රමාදයකින් පසුව 2018 ජනවාරි මස ඉදිරිපත් කර තිබුණි. තවද රු. මිලියන 58 ක පිරිවැයකට ඉටු කිරීමට තිබූ බිම් මැනීමේ කටයුතු උපදේශකයින් විසින් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉහත අවධානය යොමු කරන ලද ශක්‍යතා අධ්‍යනය යටතේ ඉදිරිපත් කළ යුතු ජල විද්‍යාත්මක අධ්‍යන වාර්තාව රු. මිලියන 11.53 කට අවසන් කර 2016 අගෝස්තු 26 දින ඉදිරිපත් කර තිබුණි.කෙසේ වෙතත් අදාල වාර්තාව රු. මිලියන 15.18 ක පිරිවැයකට සමාලෝචනය කිරීමේ අරමුණින් රාජ්‍ය සංස්ථාවක් වෙත යොමු කර තිබුණි.අදාල ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය 2017 ජුනි 01 දින විස්තරාත්මක ජල විද්‍යාත්මක අධ්‍යයනයක් රු. මිලියන 67.79 ක පිරිවැයකට ඉහත අවධානය යොමු කරන ලද රාජ්‍ය සංස්ථාව මඟින්ම සිදු කර ගැනීමට පසුව තීරණය කරන ලදි.කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අදාල රාජ්‍ය සංස්ථාව සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර ඒ පිළිබඳ වාර්තාවක් 2018 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත අනුව ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් එය ලබාගෙන නොතිබුණි.කෙසේ වෙතත් කොරිඩෝ සමීක්ෂණ හා මූලික සැකසුම් සැකසීම ආදී කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර තිබුණි.